කොළඹ විශ්වවිද්‍යාලය

ශාස්ත්‍ර පීඨය

ශාස්ත්‍රවේදී ප්‍රථම වසර උපාධි පරීක්ෂණය

දෙවන සෙමෙස්තරය - 2018/2019

**CMS 1202 - ජනමාධ්‍ය හා නිර්මාණාත්මක කලා අධ්‍යයන ප්‍රවේශය**

**ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න.** **කාලය පැය 02 යි.**

01. 'තත්කාලීන සමාජ, ආර්ථික, දේශපාලනික හා සංස්කෘතික ප්‍රවණතා මුද්‍රිත මාධ්‍ය මගින් සාධනීය ලෙස නිරූපණය වී තිබේ.' 19 වැනි සියවසෙහි ප්‍රකාශිත ශ්‍රී ලාංකේය පුවත්පත් කෙරෙහි සාවධාන ව විශ්ලේෂණය කරන්න.

02. මුද්‍රිත මාධ්‍යයෙහි නව තාක්ෂණික හා නිර්මාණාත්මක ප්‍රවණතා එහි අන්තර්ගතය, ආකෘතිය හා ග්‍රාහකත්වය කෙරෙහි බලපා ඇති ආකාරය දේශීය හා ගෝලීය උදාහරණ ඇසුරින් පෙන්වා දෙන්න.

03 'ගුවන්විදුලි භාෂාව පිළිබඳ ගැඹුරු දැනීම හා කුසලතා පූර්ණ ප්‍රායෝගික ඉදිරිපත් කිරීම මත ගුවන්විදුලි නිවේදකයකුගේ සාර්ථකත්වය රඳා පවතී.' විග්‍රහ කරන්න.

04. ශ්‍රී ලාංකේය ගුවන්විදුලි මාධ්‍යයේ පරිපාලන ව්‍යුහය හා වැඩසටහන් ආකෘති කෙරෙහි විවෘත ආර්ථිකයේ බලපෑම උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

05. 'සිනමාව සමාජ යථාර්ථය සහ දෘශ්‍ය මායාව පදනම් කොටගත් මාධ්‍යයකි.' සිනමාව පිළිබඳ ඓතිහාසික පර්යාලෝකයකින් විවරණය කරන්න.

06. විවිධ රූපවාහිනි වැඩසටහන් ප්‍රවර්ග හඳුන්වා දී ඔබට අභිමත එක් රූපවාහිනි වැඩසටහන් ප්‍රවර්ගයක් උදාහරණ සහිත ව විස්තර කරන්න.

07. 'නව මාධ්‍ය හේතු කොටගෙන මිනිසාගේ පෙර පැවති සමාජ ජීවිතය සහ පෞද්ගලික ජීවිතය පිළිබඳ බෙදුම් රේඛාව මැකී ගොස් පෞද්ගලිකත්වය පොදු අවකාශයට නිරාවරණය වී ඇත.' සාකච්ඡා කරන්න.